-----------------------------------------------------------------------------------------------------------------------------------------------

එරාවූර් පත්තු ප්‍රාදේශිය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 18 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 08 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මුල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට එරාවූර් පත්තු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මුල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

( අ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතබුණි .

( ආ ) වර්ෂය අවසානයට අතැති තොගයේ වටිනාකම භෞතිකව හර වැරදි බැලූ අගයට නොව පොත් අගයට දක්වා තිබුණි .

( ඇ ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ඈ ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු භාණ්ඩ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.2,312,782 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු. 4,907,836 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| ( i ) වරිපනම් සහ බදු | - | - | - |
| ( ii ) කල්බදු කුලී | 3,700 | 3,923 | 223 |
| ( iii ) බලපත්‍ර ගාස්තු | 1,615 | 1,025 | 590 |
| ( iv ) වෙනත් ආදායම් | 29,505 | 22,597 | 6,908 |

2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරින් ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ ප්‍රමාණය රු . 8,033,308 ක් විය .

2 .3 මුදල් වංචාව

වීදි රේඛා සහතික ලබා ගැනිම සඳහා පොදු මහජනතාවගෙන් ලද රු.13,000 ක් සභාවේ බැංකු ගිණුමෙහි තැන්පත් නොකොට සභාවට අනුයුක්ත නිලධාරියෙකු විසින් වංචා සහගතව ලබාගෙන තිබුණි.

2 .4 අවිධිමත් ගනුදෙනු

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2:14:1 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් මිළ කැඳවීම් පරිපාටි අනුගමනය නොකොට සභාවට අයත් වාහන සඳහා අගය රු.395,920 ක් වූ ටයර් සහ අමතර කොටස් මිළදී ගෙන තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 184 වගන්තියට පටහැනිව සභා රැස්වීම් සඳහා ආහාර පාන වෙනුවෙන් රු.12,155 ක් වූ වියදම් දරා තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 208 වගන්තියට පටහැනිව එක්තරා පුද්ගලයෙකුගේ අවමංගල්‍ය වියදම් සඳහා රු.4,000 ක් ගෙවා තිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය .

( අ ) ආදායම් රැස් කිරීම
( ආ ) අත්තිකාරම්
( ඇ ) අභ්‍යන්තර පාලනය

s/s .